# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 1687/45 - 2011 ජනවාරි 07 වැනි සිකුරාදා - 2011.01.07

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡේදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

විධාන අංක : 32.

**2003 අංක 09 දරන පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය පනත**

10(1)(අ) වැනි වගන්තිය යටතේ විධානය

2003 අංක 09 දරන පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය පනතේ 10(1)(අ) වැනි වගන්තිය යටතේ ක්‍රියා කරමින් යම් නිෂ්පාදකයෙකු, ආනයනකරුවකු, නියෝජිතයකු, බෙදාහරින්නෙකු හෝ වෙළෙන්දෙකු හෝ විසින් කිසියම් භාණ්ඩයක් හෝ භාණ්ඩ අලෙවි කිරීම සම්බන්ධයෙන් පුවත්පත්, චිත්‍රපට, රූපවාහිනිය, වීඩියෝ, ඕඩියෝ, ගුවන්විදුලිය, අන්තර්ජාලය හෝ වෙනයම් මුද්‍රිත, විද්‍යුත් හෝ ඉලෙක්ට්‍රොනික් මාධ්‍යවල පළ කරනු ලබන හෝ පළ කරවනු ලබන සෑම වෙළෙඳ දැන්වීමකම, එම වෙළෙඳ දැන්වීමෙහි සඳහන් භාණ්ඩයේ හෝ භාණ්ඩවල සිල්ලර මිල, එම නිෂ්පාදකයා, ආනයනකරු, නියෝජිතයා, බෙදාහරින්නා හෝ වෙළෙන්දා හෝ විසින් එම වෙළෙඳ දැන්වීමෙහි සඳහන් කළයුතු බවද, එම වෙළෙඳ දැන්වීමෙහි සඳහන් යම් භාණ්ඩයක් හෝ භාණ්ඩ විවිධ මෝස්තර, ප්‍රමාණ, වර්ග හෝ ශ්‍රේණි හෝ අනුව එහි සඳහන් කර ඇතොත් එසේ සඳහන් කර ඇති එම භාණ්ඩයේ හෝ භාණ්ඩවල එක් එක් මෝස්තරයක්, ප්‍රමාණයක, වර්ගයක හෝ ශ්‍රේණියක හෝ සිල්ලර මිල වෙන් වෙන් වශයෙන් දැක්වෙන පරිදි එම භාණ්ඩයෙහි හෝ භාණ්ඩවල සිල්ලර මිල එම නිෂ්පාදකයා, ආනයනකරු, නියෝජිතයා, බෙදාහරින්නා හෝ වෙළෙන්දා හෝ විසින් එම වෙළෙඳ දැන්වීමෙහි සඳහන් කළ යුතු බවද, සියලුම නිෂ්පාදකයින්ට, ආනයනකරුවන්ට, නියෝජිතයින්ට, බෙදාහරින්නන්ට හා වෙළෙන්දන්ට මෙයින් විධාන කරනු ලැබේ.

මේ සම්බන්ධයෙන් 2006 සැප්තැම්බර් මස 12 වැනි දින අංක 1462/10 දරන ලංකාණ්ඩුවේ *අති විශෙෂ ගැසට් පත්‍රය* මගින් ප්‍රකාශයට පත් කරන ලද විධාන අංක 07 මෙමගින් පරිච්ඡින්න කරනු ලැබේ.

මෙම විධානය වර්ෂ 2011 පෙබරවාරි මස 01 වන දින සිට බලපැවැත්වෙනු ඇත.

පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ අණ පරිදි,

රූමි මර්සූක්,
සභාපති.

2011 ජනවාරි මස 06 වැනි දින,
කොළඹ,
පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ දී ය.

01-500

1A - G 12062— 480 (2011/01) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.